# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන)

**(101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි**

---

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින් 2022 අගෝස්තු මස 31 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2022 අගෝස්තු මස 10 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[146 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 6.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයට මේ වගන්තිය මගින් පොදු සංශෝධනයක් කරනු ලබන අතර, එම සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තියේ සිංහල භාෂා පාඨයේ "චූලායවන අධිකරණය" යන වචන යෙදෙනු ලබන කවර වූ තැනක් සඳහා "සුළු හිමිකම් අධිකරණය" යන වචන ආදේශ කිරීමයි.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ LXVI වන පරිච්ඡේදය (801 සිට 833ආ වගන්තිය දක්වා එම වගන්ති දෙක ද ඇතුලු වගන්ති) ඉවත් කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ චූලායවන අධිකරණ සඳහා විශේෂ කාර්ය පටිපාටියට අදාළ විධිවිධාන ඉවත් කිරීම වේ.

***4 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධනය 3 වන වගන්තියට කරනු ලබන සංශෝධනයට ආනුෂංගික වේ.

එල්. ඩී.-ඕ. 64/2021

## (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම පිණිස වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය*

**1.** (1) මේ පනත 2022 අංක දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ පනතේ විධිවිධාන ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

*101 වන අධිකාරයට කරනු ලබන පොදු සංශෝධනය*

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ යම් විධිවිධානයක කවර වූ තැනක "චූලායවන අධිකරණය" යන වචන යෙදෙනු ලැබේ ද ඒ වචන වෙනුවට "සුළු හිමිකම් අධිකරණය" යන වචන ආදේශ කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ LXVI වන පරිච්ඡේදය ඉවත් කිරීම*

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ LXVI වන පරිච්ඡේදය (801 වන වගන්තියේ සිට 833ආ වගන්තිය දක්වා එම වගන්ති දෙක ද ඇතුළු වගන්ති) මෙයින් ඉවත් කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන උපලේඛනය සංශෝධනය කිරීම*

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන උපලේඛනයේ අංක 136 දරන ආකෘතිය ඉවත් කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව*

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.